# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 328 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 23/02/2024 පැය 2005

## මාධ්‍ය නිවේදනය

**මාතලේ නගරයේ පිහිටි අරුල්මිගු ශ්‍රී මුත්තුමාරි අම්මාන් දේවස්ථානයේ වාර්ෂික තේරු උත්සවය - රථවාහන ගමනාගමනය සීමා කිරීම සම්බන්ධව.**

මාතලේ නගරයේ පිහිටි අරුල්මිගු ශ්‍රී මුත්තුමාරි අම්මාන් දේවස්ථානයේ වාර්ෂික තේරු උත්සවය 2024.02.24 වන දින සවස 06.00 ට ආරම්භ වී තේරු රථ 05 ක් මාතලේ නගරයේ වීථි සංචාරය කර 2024.02.25 වන දින රාත්‍රී 07.00 ට අවසන් වීමට නියමිතව ඇත.

මෙම තේරු උත්සවය නැරඹීමට දිවයිනේ නන්දෙසින් බැතිමතුන් හා විදෙස් සංචාරකයින් විශාල වශයෙන් මාතලේ නගරයට ඒකරාශී වීම හේතුවෙන් නගරයේ විශාල රථවාහන තදබදයක් ඇති විය හැකි බව දැනුම් දී ඇත.

එබැවින් 2024.02.24 වන දින උදෑසන 0600 සිට 2024.02.25 වන දින රාත්‍රී 0700 දක්වා කාලය තුළ මාතලේ නගරය හරහා දඹුල්ල සිට මහනුවර දෙසට හා මහනුවර දෙස සිට දඹුල්ල දෙසට ගමන් කරන වාහන රියදුරන් හා මහජනතාවට මාතලේ නගරය හරහා ගමන් කිරීම අවම කරන ලෙසටත් පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙසටත් පොලිසිය ඉල්ලා සිටී.

- **මහනුවර දෙස සිට මාතලේ නගරය හරහා දඹුල්ල දෙසට ගමන් ගන්නා වාහන රියදුරන් භාවිතා කල යුතු විකල්ප මාර්ග.**

  කුඹියන්ගොඩ මාර්ගයෙන් පැමිණ කුඹියන්ගොඩ පාලම අසලින් වමට ඇති හුලංගමුව මාර්ගය ඔස්සේ මාතලේ නගරයේ රජවීදියට පිවිස වමට හැරී දඹුල්ල දෙසට ගමන් කල හැකිය.

- **දඹුල්ල දෙස සිට මාතලේ හරහා මහනුවර දෙසට ගමන් ගන්නා වාහන රියදුරන් භාවිතා කල යුතු විකල්ප මාර්ග.**

  තොටගමුව හන්දියෙන් වමට ඇති ඉඹුලන්දණ්ඩ මාර්ගය ඔස්සේ ගමන් කර කනන්ගමුව හන්දියෙන් දකුණට ඇති පාරාවත්ත මාර්ගයේ කළුදැවල දක්වා ගමන් කර වමට ඇති රත්තොට මාර්ගයේ වේරගම දක්වා ගමන් කර දකුණට හැරී කිවුළ හරහා මාතලේ ගොංගාවෙල මාර්ගයට පැමිණ එම මාර්ගයේ වමට

හැරී ගමන් කර මාතලේ / මහනුවර මාර්ගයට පිවිස මහනුවර දෙසට ගමන් කල හැකිය.

- ❖ **2024.02.24 වන දින තේරු රථ මාතලේ නගරය මධ්‍යයේ ඇති ප්‍රධාන වීදිය ඔස්සේ ගමන් කරන අවස්ථාවේදී මාතලේ නගරයේ තනි මංතීරුවට ඇති රජවීදිය භාවිතා කර දඹුල්ල දෙසට හා මහනුවර යන දෙපසටම රථ වාහන ගමනාගමනය සිදු කරලීමටත්,**

- ❖ **2024.02.25 වන දින තේරු රථ රජවීදිය ඔස්සේ ගමන් කරන අවස්ථාවේදී මාතලේ නගරයේ තනි මංතීරුවට ඇති ප්‍රධාන වීථිය භාවිතා කර මහනුවර දෙසට හා දඹුල්ල යන දෙපසටම රථ වාහන ගමනාගමනය සිදු කිරීමටත් සැලසුම් කර ඇත.**

මේ සම්බන්ධව මහජනතාව සහ රියදුරන් දැනුවත් කිරීම සඳහා ඔබ මාධ්‍ය මඟින් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**